තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**කේ. ජී .යූ ඉන්ද්‍රජිත් සිල්වා එ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1034/2019 (2019.06.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - කේ. ජී .යූ ඉන්ද්‍රජිත් සිල්වා
**නොතිසි ලත් පාර්ශවය** - විභාග කොමසාරිස් , ජනරාල් , නම්කල නිලධාරී, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**

අභියාචක - කේ. ජී .යූ ඉන්ද්‍රජිත් සිල්වා
පොදු අධිකාරිය - එච්,එම් .සි.ඒ . ජයුන්දර , විභාග කොමසාරිස් (පරිපාලන)
ඩී.එම් හීනටිගල (P.M.A)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.08.28 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.09.05(තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම) |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.11 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.31 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.08.28 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 11 පෙල ජේලර් සහ 11 පෙල සුහසාධක නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2017.02.18 දින පවත්වන ලද තරග විභාගයේ ප්‍රතිපල සටහන නිකුත් කර තිබේද ?*

2. *බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 11 පෙල ජේලර් සහ 11 පෙල සුහසාධක නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2017.02.18 දින පවත්වන ලද තරග විභාගයේ ප්‍රතිපල සටහනේ සහතික පිටපත් (විභාග අංක 1125)*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.11.11 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.12.31 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**
තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේදී පොදු අධිකාරිය කියා සිටියේ 2017.02.18 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 11 පෙල ජේලර් සහ 11 පෙල සුභසාධක නිලධාරීන් බඳවා ගැනීම යන නමින් තරග විභාගයක් පවත්වා නැති බව පවසා සිටියේ ය.
අදාළ තරග විභාගය සඳහා වූ අයදුම්පත අභියාචක සතුවූ ඇද්ද යන්න කොමිෂන් සභාව විමසීමේදී අභියාචක පවසා සිටියේ ඔහු සතුව අදාළ අයදුම් පත නැති බවය. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ප්‍රතිඵල අංශයෙන් විමසීමේදී 2017.02.18 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 11 පෙල ජේලර් සහ 11 පෙල පුනුරුත්ථාපන නිලධාරීන් බඳවා ගැනීම සඳහා තරග විභාගයක් පවත්වා ඇති නමුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 11 පෙල ජේලර් සහ 11 පෙල සුභසාධක නිලධාරීන් බඳවා ගැනීම සඳහා තරග විභාගයක් පවත්වා නැති බව පවසා සිටි බවත් පවසන ලදී.
තවදුරටත් අභියාචක පවසා සිටියේ ඔහුගේ මිත්‍රයෙක් මෙම විභාගය හරහා උසස් වීමක් ද ලබා ගෙන ඇති පවසා සිටියේ ය.

**නියෝගය:**

2017.02.18 දින පැවති අභියාචකට අදාළ වන තරග විභාගය සම්බන්ධයෙන් නිෂ්ශිත තොරතුරු (තරග විභාගයේ නිවැරදි නම හෝ අයදුම් පත් අංකය) පොදු අධිකාරියට ලබා දීමට අභියාචකට නියෝග කරනු ලැබේ.

තවද අදාළ වන තරග විභාගය සම්බන්ධයෙන් නිෂ්ශිත තොරතුරු ලැබීමෙන් පසු පොදු අධිකාරිය එකඟ වූ පරිදි තරග විභාගයට අදාළ ලිපිගොනු පරීක්ෂා කිරීමට අභියාචකයාට නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

ඉහත කොන්දේසියට යටත්ව අභියාචනය අවසන් කරනු ලැබේ.
****